## පාලින්දනුවර ප්‍රාදේශීය සභාව

## කළුතර දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 08 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 25 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ **1.3** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 හා 2014 වර්ෂවල අඩුවෙන් බිල් කර තිබූ රු.1,453,033 ක් වූ මුද්දර ගාස්තු ආදායම ගිණුම්වල සටහන් කිරීමේදී හිඟ හිටි මුද්දර ගාස්තු ගිණුම හර කොට සමුච්චිත අරමුදල බැර කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ආදායමට බැර කර තිබුණි.

(ආ) සේවක ඇප තැන්පත් ආයෝජන නොවන රු.35,554 ක මුදලක් සේවක ඇප තැන්පත් ආයෝජන ලෙසද, සේවක ඇප තැන්පත් ලෙසද ගිණුම් ගත කර තිබුණි.

(ඇ) පසුගිය වර්ෂයේ මෝටර් රථ හා කරත්ත ගිණුමෙන් ඇත්හැරි තිබූ රු.39,000 ක් නැවත ගිණුම් ගත කිරීමේදී, මෝටර් රථ හා කරත්ත ගිණුම හර කොට සමුච්චිත අරමුදල් ගිණුම බැර කළ යුතු වුවත් මෝටර් රථ හා කරත්ත ගිණුම හර කොට අවිනිශ්චිත ගිණුම බැර කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ඖෂධ තොගයෙහි වටිනාකම රු.258,912 ක් වූ අතර, ශේෂ පත්‍රයෙහි රු.410,264 ක් ලෙස දැක්වීම හේතුවෙන් ඖෂධ තොගය රු.151,352 ක් වැඩියෙන්ද, වර්ෂයට අදාල ඖෂධ වියදම රු.410,264 ක් වුවත් ආදායම් හා වියදම් ගිණුමෙහි වියදම ලෙස රු.258,912 ක්ද දැක්වීම හේතුවෙන් වියදම රු.151,352 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබුණු කැබ් රථය වෙනුවෙන් 2015 වර්ෂයට අදාලව අයකරගත් රු.1,059,409 ක වැටුප් ප්‍රතිපූර්ණ මුදල ප්‍රාග්ධන වියදම් ගිණුම හර කොට ආදායම් ආධාර ගිණුම බැර කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයගැති රු.1,440,033 ක් හා කර්මාන්ත ණයහිමි රු.1,440,033 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබූ අතර මූලධන ආධාර ලැබීම් හා ගෙවීම්ද එම වටිනාකමින් අඩුවෙන් ආදායම් හා වියදම් ගිණුමෙහි දක්වා තිබුණි.

### 1.3.2 අවිනිශ්චිත ගිණුම්

සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.206,109 ක අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය වර්ෂය තුළ නිවැරදි කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් වර්ෂය අවසානයට අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය රු.168,294 ක් විය.

ප්‍රධාන ලෙජරයට අනුව 2015 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.185,283 ක හර ශේෂයක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු.168,294 ක් ලෙස ගෙන තිබීමෙන් අවිනිශ්චිත ගිණුමෙහි හර ශේෂය රු.16,989 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.14,120,687 ක් වූ ගිණුම් විෂයයන් 3 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2006 වර්ෂයේ පාලින්දනුවර ප්‍රාදේශීය සභාව සහ අගලවත්ත ප්‍රාදේශීය සභාව වශයෙන් වෙන්කර වෙනම ඒකක ලෙස සංස්ථාපනය කිරීමේදී බෙදා දී තිබූ රු.6,166,759 ක් වූ ලැබිය යුතු ශේෂයද, රු.6,862,872 ක් වූ ගෙවිය යුතු ශේෂයද පදනම් කරගෙන ගිණුම් සකස් කර තිබුණද එම ශේෂ නිරවුල් කරගැනීමට විගණන දිනය වූ 2016 මැයි 10 වන විටත් පියවර ගෙන නොතිබුණි.

### 1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

(අ) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය මගින් නිකුත් කරන ලද මධ්‍යම පරිසර අධිකාරිය මගින් පළාත් පාලන ආයතනවලට බලතල පවරාදීම හා බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් මාලාවේ පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාපටිපාටිය ප්‍රකාරව බෙල්ලන තැපැල් කාර්යාලය අසල හා හැඩිගල්ල පාර බදුරලිය යන ස්ථානවල පිහිටි කර්මාන්ත 02 ක් පරිසර බලපත්‍ර ලබාගැනීමකින් තොරව ක්‍රියාත්මක කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව වර්ෂ 2 ක් ඉක්මවා තිබූ රු.516,648 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.1,737,061 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.6,051,193 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.1,153,036 ක් වූ හිඟ ආදායම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.

#### 2.2.2 වරිපනම් බදු

(අ) 2014 වර්ෂය හා ඊට පෙර සිට පැවත එන හිඟ වරිපනම් බදු ශේෂය රු.241,919 ක් 2015 දෙසැම්බර් 31 දිනටද අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා රු.1,018,436 ක් බිල් කර ඇති නමුත් ඉන් රු.648,279 ක මුදලක් පමණක් අයකරගෙන ඇති අතර ඉතිරිය වන රු.370,157 ක මුදල 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 කර්මාන්ත බදු

සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත බදුකරුවන් 142 දෙනෙකුගෙන් බදු මුදල් අයකර තිබූ අතර ඊට අදාල සමීක්ෂණ වාර්තා පැවතියේ බදුකරුවන් 06 දෙනෙකුගේ පමණි.

#### 2.2.4 ව්‍යාපාර බදු

(අ) සමාලෝචිත වර්ෂයේ රු.808,250 ක් වූ ව්‍යාපාර බදු බිල් කළ ආදායමෙන් රු.52,000 ක් හිඟව පැවතුණි.

(ආ) සභාව මගින් සමීක්ෂණය කරන ලද ව්‍යාපාර 12 කට අදාල සමීක්ෂණ වාර්තා තොරතුරු ව්‍යාපාර බදු ලේඛනයේ සටහන් කර නොතිබුණි.

#### 2.2.5 වෙනත් ආදායම්

2015 වර්ෂය සඳහා පොල බදු එකතු කිරීමේ අයිතිය වෙනුවෙන් ඉදිරිපත් කරනු ලැබූ ප්‍රසම්පාදන අවස්ථා දෙකේදීම කිසිදු ප්‍රසම්පාදන අයදුම්පතක් ඉදිරිපත් වී නොතිබුණු අතර සභාපතිගේ උපදෙස් පරිදි පොල බදු එකතු කිරීම ආදායම් පරීක්ෂකට භාර දී තිබුණි. පළමු මාස 3 තුළදී රු.487,510 ක ආදායමක් ලැබී තිබුණද 2015 අප්‍රේල් සිට මසකට රු.161,111 ක් බැගින් සභාවට බදු වශයෙන් ලබාදීමට බදු එකතු කිරීමේ අයිතිය

ආදායම් පරික්ෂකට පවරා තිබුණි. ගිවිසුමට අනුව මාස තුනක එනම් රු.483,333 ක ඇප තැන්පතුවක් ටෙන්ඩර් ලාභියා විසින් ගෙවිය යුතු වුවත් එක් මසකට පමණක් ඇප තබා ඇති බව නිරීක්ෂණය විය. ගිවිසුමට අනුව අදාල මාසයේ 25 දිනට මුදල් නොගෙවීම නිසා දඩ මුදල් වශයෙන් රු.9,861 ක් සභාවට අයවිය යුතු වුවත් දඩ මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ක්‍රියාවලිය සඳහා අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

2.2.6 **<u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.8,465,734 ක මුදලක් පහත පරිදි ලැබිය යුතුව තිබුණි.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 5,465,734 |
| මුද්දර ගාස්තු | 3,000,000 |

2.2.7 **<u>දැන්වීම් පුවරු ගාස්තු</u>**

සභාව මගින් දැන්වීම් පුවරු ආදායම් අයකරගැනීම සඳහා වාර්ෂිකව දැන්වීම් පුවරු සමීක්ෂණ සිදු කර සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත් දැන්වීම් පුවරු සම්බන්ධයෙන් සමීක්ෂණ වාර්තා 2015 වර්ෂය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

2.2.8 **<u>මාළු වෙළඳසැල් බදුදීම</u>**

(අ) මාළු වෙළෙඳසැල් බදු දීමේදී ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබූ අවස්ථා අනාවරණය විය.

(ආ) වාරික බදු මුදල් ප්‍රමාද වූ අවස්ථාවේදී ගිවිසුම් පරිදි නිසි දඩ මුදල් අයකර නොතිබුණි.

(ඇ) නිශ්චිත දිනයන්හිදී මාසික බදු මුදල් අයකරගෙන නොතිබුණි.

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3.1 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

සමාලෝචිත වර්ෂය තුළදි සභාවේ අනුමැතියක් නොමැතිව කර්මාන්ත ණයගැති ගිණුමෙන් රු.13,909,971 ක් කපා හැර තිබුණි.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය